B.V

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2015

## 25 - ශ්‍රී ලංකා ඉතිහාසය

### ලකුණු බෙදීයාම

| | | | |
|---|---|---|---|
| I කොටස | 01 x 40 | = | 40 |

**II කොටස**

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| සෙසු ප්‍රශ්න 3 කට 14 බැගින් | = | 42 |
| II කොටස අවසාන ලකුණු | = | 60 |

අවසාන ලකුණු = 40 + 60 = 100



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015


ඉතිහාසය I
வரலாறு I
History I

25 S

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

ප්‍රශ්න අංකය
வினா இல.
Question No. 1

විභාග අංකය
சுட்டெண்
Index No. ..............................



1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) නාගදීප (ii) ගෝණ නදී (iii) නාච්චදූව වැව (iv) ගාල්ල

(v) මහනුවර (vi) මඩකලපුව (vii) මල්වාන (viii) ඌව පළාත

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගින්)

2. "මහාසේන රාජ්‍යසමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහි ලා වංසකථා සුවිශේෂී වැදගත්කමකින් යුක්ත වේ."

(i) දැනට ඉතිරි වී තිබෙන ආදිතම වංශකථාව කුමක්ද?

දීපවංසය

(ලකුණු 01 යි)

(ii) මහාවංසයේ කතුවරයා සහ එය රචිත කාලය නම් කරන්න.

දික්සඳ සෙනෙවි පිරිවෙන්පති මහානාම හිමි.

ක්‍රි.ව. 5 වන හෝ 6 වන සියවස.

(ලකුණු 02 යි)

(iii) අනුරාධපුර යුගයේ රචිත වංසකථා පිළිබඳ සටහනක් ලියන්න.

- අනුරාධපුර අවධියේ රචිත මුල්ම වංසකථාව, දීපවංසය වන අතර එය මාගධී බසින් ගද්‍යයෙන් හා පද්‍යයෙන් ලියා ඇත.
- පරිච්ඡේද 22කින් යුත් මෙහි ක්‍රි.පූ. සවැනි සියවසේ සිට මහාසේන රාජ සමය දක්වා ශාසනික හා රාජවංශ ඉතිහාසය අන්තර්ගතය.
- කතුවරයෙකු සඳහන් නොවන දිපවංසය යම් යම් දෝෂ සහිත වුවත් මහාවංසයේ සඳහන් නොවන තොරතුරු එහි අන්තර්ගතව තිබීම වැදගත්ය.
- භික්ෂූණීන් පිළිබඳ තොරතුරු වැඩි වශයෙන් අඩංගු නිසා ඇතැම්හු මෙය භික්ෂූණියක විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් සේ සලකති.
- දීපවංසය රචනා කළ අවධියම ආවරණය කරමින් සියලු දෝෂ අවම කරලීම පිණිසත් මනා ධාරණයට පිටුවහලක් ලැබෙන පරිද්දෙනුත් පරිච්ඡේද 37ක් ඇතුළත් කොට මහාවංසය රචනා කොට තිබේ.
- දික්සඳ පිරිවෙන්පති මහානාම හිමියන් විසින් මහාවංසය රචනා කරන ලද බව වංසත්ථප්පකාසිනිය දක්වන අතර සීහලට්ඨකථාව ඇතුළු මූලාශ්‍ර [illegible] මහාවංස කතුවරයා පරිශීලනය කළ බව නාමිකව දක්වන තොරතුරුවලින් හෙළි වේ.
- මහාසේන රාජ්‍යසමය දක්වා රාජවංශ හා ශාසනික ඉතිහාසය ගෙනහැර දක්වන මහාවංසයෙහි දුට්ඨගාමණී රජුට විශේෂ ස්ථානයක් ලබා දී ඇත.
- ආර්ථික, සමාජ හා සංස්කෘතික ඉතිහාසය මෙන්ම පාලන ව්‍යුහය අධ්‍යයනය කිරීමේදීත් දීපවංසය මෙන්ම මහාවංසයද වැදගත් වේ.
- ධාතුවංසය හෙවත් ලලාටධාතුවංසයත් පාලි බෝධිවංසයත් අනුරාධපුර අවධියේ ලියැවුණු වංසකථා ලෙස සැලකේ.

(ලකුණු 04 යි)

(iv) ඉහත සඳහන් ප්‍රකාශය විචාරාත්මක ව විමසන්න.

- ක්‍රි.පූ. සවැනි සියවසේ සිට මහාසේන පාලන අවධියේ අවසානය දක්වා අඛණ්ඩ ඉතිහාසයක් සකස් කර ගැනීමට උපකාරී වීම.
- ශිලා ලේඛන මුල් කරගත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රගත තොරතුරු වඩාත් විශ්වසනීය ලෙස හඳුනාගැනීමට සහ පාලක නාම හා පාලක ඥාතිත්වය මතුකර ගැනීමට වංසකථාවලින් සහායක් ලැබීම (නිදසුන් සහිතව සාකච්ඡා කිරීම වැදගත්ය).
- සමාජීය හා සංස්කෘතික තොරතුරු වංසකථා මගින් හෙළිකර ගත හැකි අතර පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් ඒවා සනාථ කරගත හැකිවීම.
- ජනාවාස හා ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු වංසකථා මගින් හෙළිදරව්වීම හා ඒවා පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් සනාථවීම.
- පාලන තන්ත්‍රයේ වෙනස්වීම්, ඒ සඳහා බලපෑ දෙස්-විදෙස් සබඳතා, පාලනය හා බැඳුණු නිලධාරීන්, හා පාලන ඒකක පිළිබඳව දක්වෙන වංසකථා තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් සනාථ වීම.
- කෘෂිකර්මාන්තය හා වෙළඳාම, විදේශ සබඳතා, වාරි කර්මාන්ත හා වාරි තාක්ෂණය සම්බන්ධයෙන් වංසකථා දක්වන තොරතුරු පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් තහවුරු වීම.
- පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් හෙළිවන පුද්ගල නාම හා ස්ථාන නාම හඳුනාගැනීමේදී වංසකථාවල දායකත්වය සුවිශේෂී වීම.
- සාහිත්‍ය මූලාශ්‍ර ගණයක් ලෙස සැලකෙන වංසකථාවල යම් යම් දුර්වලතා තිබුණද සමස්තයක් වශයෙන් ගත්විට අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනැගීම සඳහා ඒවායින් ලැබෙන දායකත්වය ඉතා වැදගත්ය.

(ලකුණු 07 යි)

3. වට්ටගාමණී අභය රාජ්‍යසමයේ වැදගත්කම පහත දැක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

(i) රජු මුහුණ දුන් දේශීය හා විදේශීය අභියෝග සහ එතුමා ඒවා ජයගත් අන්දම

- වට්ටගාමිණී අභය රජු දේශීය හා විදේශීය අභියෝග රැසකට මුහුණ දුන් පාලකයෙකි. එම සෑම අභියෝගයක්ම ජයගෙන විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට බේරාගත් පාලකයෙක් ලෙස ඔහු ලක් ඉතිහාසයේ වැදගත් වේ.
  - ✓ මහාරත්තක ඝාතනය කොට රාජ්‍යය ලබා ගැනීම.
  - ✓ තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල.
  - ✓ සත් ද්‍රවිඩ ආක්‍රමණය. (පුලහත්ථ, බාහිය, පනයමාර, පිළියමාර, දාඨිය)
  - ✓ ගිරි නිගන්ඨයාගේ විරෝධය.
  - ✓ බැමිණිටියාසායට මුහුණපෑම.
  - ✓ තනිව සේනා සංවිධානය කර ගැනීම.
  - ✓ සේනාපතිවරුන් රජු හැර යාම.

(ii) අභයගිරි විහාරය පිහිටුවීම

- ක්‍රි.පූ. 89 දී දාඨිය මරා අනුරාධපුර රාජ්‍ය බලය නැවත ලබා ගැනීමෙන් පසුව ගිරි නිගණ්ඨ ආරාමය කඩා බිඳදමා අභයගිරි විහාරය තැනවීම.
- නැවත සේනා සංවිධානය කළ අවස්ථාවේ රජුට උපකාර කළ කුපික්කල මහා තිස්ස තෙරුන්ට අභයගිරි විහාරය පූජා කිරීම.
- මහා විහාරයෙන් ඉවත් වූ භික්ෂු පිරිස් අභයගිරියට එක්වීම හා සංඝ භේදයකට මග පෑදීම.
- රජුගේ විශේෂ අනුග්‍රහය අභයගිරියට හිමිවීම.
- පසුකාලීනව මහායාන අදහස් අභයගිරියට බලපෑමත් විදේශීය බෞද්ධ මධ්‍යස්ථාන සමග සබඳතා පැවැත්වීමත් නිසා අභයගිරිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම.



Scanned with CamScanner

**(iii) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම**

- බැමිණිටියාසාය නිසා භික්ෂු පරම්පරා මෙන්ම එතෙක් මුඛපරම්පරාගතව ආරක්ෂා කරගෙන ආ ත්‍රිපිටක ධර්මයද අභාවයට පත්වීමෙ තර්ජනයක් මතුවීම.
- වට්ටගාමිණී අභය පාලන සමයේදී ප්‍රාදේශීය පාලකයෙකුගේ අනුග්‍රහය යටතේ මාතුල ජනපදයේ ආලෝක ලෙනේදී ත්‍රිපිටකය හා අට්ඨකතා පළමුවරට ග්‍රන්ථාරූඪ කරනු ලැබීම.
- අභියෝග හමුවේ වුවද ථෙරවාදි බුදු දහම මෙරට ස්ථාපිත කිරීමට එමගින් හැකි වීම.

**(ලකුණු 14 යි)**

**4. අනුරාධපුර රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට තුඩු දුන් ප්‍රධාන සාධක විචාරාත්මක ව විමසන්න.**

- ➢ සියවස් 14ක් පමණ පැවති අනුරාධපුර රාජධානිය පිරිහීමට හා බිඳවැටීමට විවිධ හේතු බලපා ඇත.
- ➢ ආසන්නතම හේතුව - චෝළ ආක්‍රමණ (I රාජ රාජ සහ I රාජේන්ද්‍ර)
- ➢ අනුරාධපුර යුගයේ අවසාන කාලයේ සිහසුනට දුර්වල පාලකයන් පත්වීම හා ඔවුන්ගේ රාජ්‍යකාල කෙටි වීම.
- ➢ මධ්‍යගත පාලනය දුර්වල වීම.
- ➢ කුලී හමුදාවේ ක්‍රියා කලාපය (වේලක්කාර හමුදාව).
- ➢ වරින්වර එල්ල වූ දකුණු ඉන්දියානු ආක්‍රමණ.
- ➢ එම වාතාවරණය හේතුකොටගෙන අනුරාධපුරය අනාරක්ෂිත වීම හා පොළොන්නරුව ආරක්ෂිත ස්ථානයක් ලෙස හඳුනා ගැනීම.
- ➢ මෞර්ය හා ලම්භකර්ණ රාජවංශ දෙක අතර පැවති බල අරගලය.
- ➢ වාරි කටයුතු අඩපණ වීම නිසා කෘෂි ආර්ථිකයේ ඇති වූ පරිහානිය.

**(ලකුණු 14 යි)**

**5. පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ කාර්ය සාඵල්‍යය පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.**

**(i) දිවයින එක්සේසත් කිරීම**

- ➢ දක්ඛිණ දේශයේ පාලකයා බවට පත්වීම. පඬුවස්නුවර (පරාක්‍රම පුරය) පාලන මධ්‍යස්ථානය කරගැනීම.
- ➢ රජරට අල්ලාගැනීම සඳහා ජයබාහු සමග සටන් කිරීම.
- ➢ මලය දේශය යටත් කරගැනීම.
- ➢ පොළොන්නරුව අල්ලාගැනීම ගජබාහු සමග සම්මුතියකට එළඹීම (සංගමු විහාර සෙල්ලිපිය), ගජබාහුගෙන් පසු මනාභරණට එරෙහිව සටන් කිරීම. ක්‍රි.ව. 1153 දී පොළොන්නරුවේ රජකමට පත්වීම.
- ➢ රුහුණේ කැරලි ඇතිවීම. සුගලා බිසව පරාජය කිරීමෙන් එම කැරලි මර්දනය කිරීම.
- ➢ අගනගරය වූ පොළොන්නරුව මුල් කරගෙන මධ්‍යගත පරිපාලන සංවිධානයක් ගොඩනැගීම.

**(ලකුණු 07 යි)**

**(ii) ආගමික සේවය**

- ➢ සංඝ සංශෝධනයක් ඇතිකොට, සංඝ සාමග්‍රියක් ඇති කිරීම. භික්ෂූන් එක්සත්කොට, සඟරජ හිමිගේ නායකත්වය යටතේ සඟ පරපුරක් බිහිකිරීම.
- ➢ භික්ෂු කතිකාවතක් පොළොන්නරුවේ ගල් විහාරයේ පිහිටුවීම.
- ➢ අළාහන පිරිවෙන මුල් කොටගත් වෙහෙර විහාර රැසක් පොළොන්නරුවේ ඉදිකරවීම.
- ➢ වෙනත් ප්‍රදේශවල වෙහෙර විහාර ගොඩනැංවීම හා ප්‍රතිසංස්කරණය කිරීම.
- ➢ අග්නිදිග ආසියානු ප්‍රදේශ සමග ආගමික සබඳතා පවත්වාගෙන යාම.

**(ලකුණු 07 යි)**



Scanned with CamScanner

**(iii) වාරි කටයුතු හා ආර්ථික සංවර්ධනය**

- ➢ දක්ෂිණ දේශයේ පාලකයා වශයෙන් සිටියදී දැදුරු ඔය ආශ්‍රිතව කළ වාරිමාර්ග කටයුතු (අමුණු - කොට්ඨ බද්ද, සූකරනිජ්ඣර, දෝරද්වාරික).
- ➢ ඒ ආශ්‍රිතව විශාල ඉඩම් ප්‍රමාණයක් අස්වද්දා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම.
- ➢ මුළු දිවයිනේම පාලකයා වීමෙන් පසුව කරවන ලද වාරි කටයුතු.
- ➢ පරාක්‍රම සමුද්‍රය ඇතුළු සංකීර්ණ වැව් ජාලය, වැව් ඒකාබද්ධ කිරීම, ඇළවල් රාශියක් ඉදිකරවීම.
- ➢ රට සහලින් ස්වයංපෝෂිත කරවීම (පෙරදිග ධාන්‍යාගාරය).
- ➢ වැව් ප්‍රතිසංස්කරණය කරවීම - මින්නේරිය, කවුඩුල්ල, ගිරිතලේ.

(ලකුණු 07 යි)

**(v) විදේශ සම්බන්ධතා**

- ➢ බුරුම ආක්‍රමණය (රාමඤ්ඤ දේශය).
- ➢ දකුණු ඉන්දියාවේ චෝළ විරෝධී පාණ්ඩ්‍යයන්ට ආධාර පිණිස හමුදා යැවීම නිසා චෝළයන් සමඟ ගැටුම් ඇති කරගැනීම.
- ➢ කාම්බෝජය සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම.
- ➢ බුරුමය සමඟ ආගමික සම්බන්ධතා ඇති කරගැනීම.

(ලකුණු 07 යි)

**6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් හා ලන්දේසීන් අනුගමනය කළ පරිපාලන ප්‍රතිපත්ති පහත දැක්වෙන අංශ ඇසුරෙන් සංසන්දනාත්මක ව පරීක්ෂා කරන්න.**

**(i) අරමුණු**

- ➢ පෘතුගීසීන්ගේ මෙන්ම ලන්දේසීන්ගේත් ප්‍රධාන අරමුණ වූයේ ලංකාවෙන් කුළුබඩු - විශේෂයෙන් කුරුඳු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීමයි.
  - පෘතුගීසි යටත් විජිත කටයුතු, පෘතුගාලයේ රාජ්‍ය අධිකාරිය විසින් මෙහෙයවන ලද අතර, ලන්දේසි යටත් විජිත කටයුතු ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් මෙහෙයවන ලදී.
  - මේ තත්ත්වය යටතේ ලන්දේසීන් අතර වෙළඳ (ආර්ථික) අරමුණු වඩාත් බලපැවැත්වූ බව කිව හැකිය.
- ➢ ආගම් ප්‍රචාරය කිරීමේ අරමුණ :
  - පෘතුගීසීන් - කතෝලික ආගම
  - ලන්දේසීන් - ප්‍රොතෙස්තාන්ත ආගම
- ➢ ලංකාව තුළ සිය දේශපාලන බලය පිහිටුවීම

**(ii) මධ්‍ය පාලනය**

- ➢ පෙරදිග පෘතුගීසි අධිරාජ්‍යයේ මූලස්ථානය ගෝවේ හි ස්ථාපිත කොට තිබූ අතර එහි ප්‍රධානියා ප්‍රතිරාජයා ලෙස හැඳින්විණ.
- ➢ පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ මූලස්ථානය ජාවා දූපතේ බතාවියාවේ පිහිටුවා තිබූ අතර එහි ප්‍රධානියා, මහාණ්ඩුකාරවරයා ලෙස හැඳින්විණ.
- ➢ ලංකාවේ පෘතුගීසි පාලන සංවිධානයේ ප්‍රධානියා වූයේ කපිතාන් ජෙනරාල්වරයාය. පූර්ණ බලතල ඔහුට තිබූ අතර, විදෝර් ද පසෙන්දා හා උව්දෝර් ද පසෙන්දා යන නිලධාරීහු රාජ්‍ය ආදායම් පාලන හා අධිකරණ අංශවල ප්‍රධානීන් වූහ.
- ➢ ලන්දේසි පාලන සංවිධානයේ ප්‍රධානියා වූයේ ආණ්ඩුකාරවරයාය. ඔහුට සහාය වීමට උපදේශක සභාවක් තිබූ අතර ඔහුට පූර්ණ බලතල පැවතුණි.
- ➢ දෙපක්ෂයම, ඉහළ නිලතලවලට, ස්ව-ජාතිකයන්ම පත් කළහ.

පෘතුගීසි

- කෝට්ටේ රාජ්‍යයේ පැවති පාලන රටාව එලෙසින්ම ක්‍රියාත්මක කිරීම.
- ඔවුන් යටතේ පැවති ප්‍රදේශය දිසාවනි හතරකට බෙදා තිබීම (මාතර, සබරගමුව, සත් කෝරළය, සතර කෝරළය).
- දිසාවනියක් තුළ කෝරළ, පත්තු හා ගම් අඩංගු වූ පරිපාලන සංවිධානය.
- කපිතාන්වරයෙකු යටතේ වූ යාපනය ප්‍රදේශයේත් එම ප්‍රදේශයේ කලින් ක්‍රියාත්මක වූ ස්වදේශික පාලන ව්‍යුහය හා පාලන නිලතල එලෙසම ක්‍රියාත්මක කිරීම.
- දිසාවනියක් සඳහා දිසාවේවරයෙකු පත්කරන ලද අතර ඒ සඳහා පෘතුගීසි ජාතිකයෙකුම පත් කිරීම.
- දේශීය බද්ද සංවිධානය, රාජකාරී ක්‍රමය හා ඉඩම් භුක්ති ක්‍රමය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කිරීම.

ලන්දේසි

- ලන්දේසීන් ද දේශීය පාලන ව්‍යුහය හා යාන්ත්‍රණය එලෙසින්ම ක්‍රියාත්මක කිරීම.
- ලන්දේසි පාලන ප්‍රදේශය කොමාන්ඩරිවලට (දිසාවනි) බෙදා තිබීම (කොළඹ, ගාල්ල, යාපනය) - ඒවා කොමදෝරුවරුන් යටතේ පාලනය වීම.
- කොමාන්ඩරි තුළද කලින් පැවති දේශීය පාලන ව්‍යුහය හා පාලන නිලතල ක්‍රියාත්මක කිරීම.
- ඉහළ නිලතලවලට ලන්දේසි ජාතිකයන් පත් කිරීම.
- දේශීය බද්ද සංවිධානය, රාජකාරී ක්‍රමය හා ඉඩම් භුක්ති ක්‍රමය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කිරීම.
- පෘතුගීසීන්ට වඩා අධිකරණ පරිපාලනය කෙරෙහි සැලකිලිමත් වීම.

(ලකුණු 14 යි)

7. "උඩරට ගිවිසුමෙන් දෙන ලද පොරොන්දු ඉටු නොවීම නිසා උඩරටියන් තුළ හටගත් බලාපොරොත්තු සුන්වීම, 1817 - 1818 බ්‍රිතාන්‍ය විරෝධී සටන ඇතිවීමට තුඩු දුන් ප්‍රධාන සාධකය විය."

**(i) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට රාජධානිය අල්ලා ගනු ලැබීමට ආසන්න සමයේ එම රාජධානිය සමඟ සම්බන්ධකම් පවත්වාගෙන ගිය ඉංග්‍රීසි ජාතික නිලධාරියා නම් කරන්න.**

ජෝන් ඩොයිලි

(ලකුණු 01 යි)

**(ii) උඩරට ගිවිසුම අත්සන් කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා සහ උඩරට ප්‍රභුවරයකු නම් කරන්න.**

ආණ්ඩුකාරයා - රොබට් බ්‍රවුන්රිග්

ප්‍රභුවරු - ඇහැලේපොළ, මොල්ලිගොඩ, පිළිමතලව්වේ, මොනරවිල, රත්වත්තේ, දුල්ලෑව, මිල්ලෑව, ගලගම, ගලගොඩ

(ලකුණු 02 යි)

**(iii) උඩරට ගිවිසුමේ අන්තර්ගත කරුණු සැකෙවින් දක්වන්න.**

- 1815 මාර්තු 2 සෙංකඩගල මඟුල් මඩුවට රැස්වූ අදිකාරම්, දිසාවේ, නිලමේවරු හා ඉංග්‍රීසි රජුගේ නියෝජිතයා ලෙස ආණ්ඩුකාරයා ඉදිරියේ කියවා අත්සන් තබන ලද ලේඛනය උඩරට ගිවිසුම යි. මෙය වගන්ති 12 කින් සමන්විත ය.
- 1,2,3 වගන්ති - 'මලබාර්' පාලකයා ලෙස හඳුන්වා ඇති ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලනය දුර්දාන්ත එකක් බවත්, ඔහු ජනතා අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවත්, ඒ නිසා එම පාලකයා බලයෙන් පහකොට ඔහු ඇතුළු ඔහුගේ නායක්කර් ඥාතීන් පිටුවහල් කරන ලද බවත් සඳහන් කරයි.



Scanned with CamScanner

- 4 වගන්තිය - උඩරට රාජ්‍යය තුන්වන ජෝර්ජ් රජුට පවරන ලද බවත් ඒ පළාත්වල පාලනය එංගලන්තයේ රජු වෙනුවෙන් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා සිය ඒජන්තවරුන් මගින් ගෙනයන බවත්, දේශීය ප්‍රධානීන්ගේ හා මුලාදෑනීන්ගේ නිලතල හා සම්බන්ධ අයිතිවාසිකම්, වරප්‍රසාද සහ බලතල ආරක්ෂා කරන බවත් සඳහන් කරයි.
- 5 වගන්තිය - බෞද්ධාගම හා දේවාගම අනුල්ලංඝණීය බවත් ඒවාට අදාළ පුදපූජා, පිළිවෙත්, පූජ්‍ය ස්ථාන හා පැවිද්දන් බ්‍රිතාන්‍ය රජය විසින් ආරක්ෂා කරන බවත් සඳහන් කරයි.
- 6, 7, 8 වගන්ති - උඩරට වැසියන්ගේ සිවිල් හා අපරාධ නඩු පවතින ක්‍රමයටම විසඳන බව සඳහන් කරන අතර ශාරීරික වධහිංසා පැමිණවීම, අංග විච්ඡේදනය ආදි දඬුවම් තහනම් කරන බවත් ආණ්ඩුකාරයාගේ නියමයකින් තොරව මරණ දණ්ඩනය නියම නොකරන බවත් දක්වයි.
- 9 වගන්තිය - උඩරට වැසියන් නොවන පුද්ගලයන් සම්බන්ධ සිවිල් හා අපරාධ නඩු ඉංග්‍රීසි නීතිය ප්‍රකාර විසඳන බවත් හමුදා නිලධාරීන් සම්බන්ධ නඩු යුධ හමුදා නීතිය ප්‍රකාර විසඳන බවත් දක්වයි.
- 10 වගන්තිය - සීමිත ව්‍යතිරේඛ අවස්ථාවල්දී හැරුණුකොට හමුදා මෙහෙයුම් කාලයේ ප්‍රසිද්ධ කරන ලද ආඥා මේ ගිවිසුම මගින් අවලංගු වන බව සඳහන් කරයි.
- 11 වගන්තිය - උඩරට ආදායම් ඉංග්‍රීසි රජු වෙනුවෙන් ඒජන්තවරුන් එකතු කරන බව දක්වයි.
- 12 වගන්තිය - උඩරට හා පහතරට අතර වෙළඳාමට පැවති බාධා අහෝසි කරන බවත් අවශ්‍ය අවස්ථාවලදී පාලනයේ වෙනස්කම් ඇති කිරීමේ අයිතිය ඉංග්‍රීසි ආණ්ඩුව සතුව තබාගන්නා බවත් සඳහන් කරයි.

**(ලකුණු 04 යි)**

**(iv) ඉහත සඳහන් ප්‍රකාශය විචාරාත්මක ව විමසන්න.**

- නායක්කර් පාලනය අවසන් කොට ස්වදේශික පාලනයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමටට ඉංග්‍රීසීන් කටයුතු කරනු ඇතැයි උඩරටියන් බලාපොරොත්තු වුවත් එය ඉටු නොවීම.
- උඩරට රාජත්වය අහෝසි කිරීම.
- බෞද්ධාගම ආරක්ෂා කරන බව ගිවිසුමේ සඳහන් කළද උඩරට රජු යටතේ පැවති සම්භාවනීයත්වය හා ආරක්ෂාව අන්‍යාගමික පාලකයන්ගෙන් නොලැබෙන බව භික්ෂූන්ට අවබෝධ වීම.
- ප්‍රධානීන්ගේ නිලතල හා වරප්‍රසාද ආරක්ෂා කරන බවට පොරොන්දු වුවත් ඔවුන්ට ඉහළින් ඉංග්‍රීසි නිලධාරීන් පත් කිරීම නිසා ඔවුන්ගේ ගරුත්වයට තර්ජනයක් එල්ලවීම හා සාමාන්‍ය ජනයා ඉදිරියේ ඔවුන්ගේ අභිමානයට හානියක් වීම.
- පරිපාලනයේදී දේශීය චාරිත්‍ර හා ආයතන ආරක්ෂා කරන බවට ගිවිසුමෙන් පොරොන්දු වූ නමුත් විදේශීය නිලධාරීන් හා විදේශීය භාෂාව භාවිත වීම නිසා පරිපාලන හා අධිකරණ කටයුතු ජනතාවට ආගන්තුක වීම.
- විදේශීය පාලකයන් ඉවත් ව නොයන බව පෙනී යාමත් සමග පොදුවේ හටගත් කලකිරීම නිසා භික්ෂූන් වහන්සේ, රදළ ප්‍රධානීන් හා ජනතාව යන පාර්ශව තුන තුළම බ්‍රිතාන්‍ය පාලනය කෙරෙහි අප්‍රසාදයක් හටගැනීම.
- මේ අනුව සටන ඇතිවීමට තුඩු දුන් **ප්‍රධානතම සාධකය** ඉංග්‍රීසින් ගිවිසුමෙන් වූ පොරොන්දු ඉටු නොකිරීම බව කිව හැකියි.

**(ලකුණු 07 යි)**

Scanned with CamScanner

**8. <u>එක්කෝ (A)</u> කොටසට නැතහොත් <u>(B)</u> කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

**(A) කෝල්බෲක්-කැමරන් කොමිසම විසින් යෝජනා කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණවල වැදගත්කම පරීක්ෂා කරන්න.**

- ➢ කෝල්බෲක්-කැමරන් කොමිසම පත් කරන ලද්දේ ප්‍රධාන වශයෙන් යටත් විජිත ආණ්ඩුව මුහුණ දුන් අයවැය හිඟය පියවාගැනීම සඳහා ප්‍රතිකර්ම යෝජනා කිරීම සඳහාය.
- ➢ එබැවින් ඉංග්‍රීසීන් එතෙක් අනුගමනය කළ යටත්විජිත ආර්ථික ප්‍රතිපත්තියේ මූලික වෙනසක් ඇතිකිරීමට කෝල්බෲක් කොමිසම යෝජනා කළේය. එබැවින් කොමසාරිස්වරුන් ඉදිරිපත් කළ ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා ඉතාමත් වැදගත් වන අතරම, ඔවුන් ඉදිරිපත් කළ අනෙකුත් යෝජනා බොහෝමයක්ද එම ආර්ථික සාධකය තුළ ගැබව ඇති බව කිව හැකිය.
- ➢ යටත් විජිත ආණ්ඩුව මුහුණ දුන් ප්‍රශ්නයට කොමසාරිස්වරුන් ඉදිරිපත් කළ විසඳුම වූයේ පෞද්ගලික ව්‍යවසාය පදනම් කොටගත් රාජ්‍ය නිර්බාධවාදීආර්ථික ප්‍රතිපත්තියයි.
- ➢ මේ සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රධාන යෝජනාඃ
  - රාජකාරි ක්‍රමය අවලංගු කිරීම (විහාර-දේවාලගම්වල හා නින්දගම්වල හැර) - හේතුඃ ඉඩම් හා ශ්‍රම වෙළඳපොලක් නිර්මාණය කිරීම. ඉංග්‍රීසීන් විසින් ක්‍රියාත්මක කරන ලද ආකාරය අනුව එය ජනතාවට ඉතාමත් පීඩාකාරී වීම.
  - රාජ්‍ය වෙළඳ ඒකාධිකාර අහෝසිකිරීම (කුරුඳු, ලුණු, මුතු, අරක්කු, දුම්කොළ)
  - ඉඩම් මිලදීගැනීමට එරෙහිව පනවා තිබූ නීති ලිහිල් කිරීම.
  - නිර්යාතවලින් තීරු බදු අයකිරීම.
  - පෞද්ගලික ව්‍යවසාය දිරිමත් කිරීම.
  - රජයේ වියදම අඩුකිරීමට පියවර ගැනීමඃ
    - ✓ උඩරට-පහතරට ඒකාබද්ධ කොට ලංකාව පළාත් 5 කට බෙදීම.
    - ✓ ඇතැම් තනතුරු අහෝසි කිරීම හා ඇතැම් තනතුරු ඒකාබද්ධ කිරීම මගින් සිවිල් සේවක සංඛ්‍යාව අඩු කිරීම.
    - ✓ සිවිල් සේවක වැටුප් අඩු කිරීම.
    - ✓ සිවිල් සේවක විශ්‍රාම වැටුප් අවලංගු කිරීම.
    - ✓ සිවිල් සේවකයන්ට පෞද්ගලික ව්‍යවසායවල යෙදීමට අවසර දීම.
    - ✓ ධනවාදී අර්ථ ක්‍රමයක් ගොඩනැංවීමට පියවර ගැනීම.
    - ✓ ආර්ථිකයේ පමණක් නොව සමාජයේත් මූලික පරිවර්තනයක් ඇතිවීමට කෝල්බෲක් ප්‍රතිසංස්කරණ බලපෑම.

**(ලකුණු 14 යි)**

**(B) දහනවවැනි සියවසේ දෙවන භාගයේ ඇති වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න.**

- ➢ ක්‍රිස්තියානි මිෂනාරි සංවිධාන හා ඇතැම් ඉංග්‍රීසි නිලධාරීන් සිය ආගම හා සංස්කෘතිය ප්‍රචාරය කිරීමටත් අධ්‍යාපනය ප්‍රචලිත කිරීමටත් ක්‍රියා කිරීමට එරෙහිව ස්වදේශිකයින් අතුරෙන් එල්ල වූ ප්‍රතික්‍රියාවක් ලෙස දේශීය ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයක් ඇතිවීම.
- ➢ ජාතික අභිමානය හා සවිඥානකත්වය වර්ධනය වීම, හා ජාතික අනන්‍යතාව ගොඩනැගීම ද ඊට හේතුවීම.
- ➢ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය බෞද්ධයන් මෙන්ම හින්දූන් හා ඉස්ලාම් භක්තිකයන් අතර ද ඇතිවීම.



Scanned with CamScanner

➢ <u>බෞද්ධ පුනර්ජීවනය</u>

- පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රබෝධයක් ඇතිවීම-පරමධම්ම චේතිය, විද්‍යෝදය, විද්‍යාලංකාර
- බෞද්ධ හා ක්‍රිස්තියානි දෙපාර්ශවය අතර වාද ඇතිවීම.
- පරමවිඥානාර්ථවාදීන් (ඕල්කට් හා බ්ලැවත්ස්කි) ලංකාවට පැමිණීම. බෞද්ධ පරමවිඥානාර්ථ සංගමය පිහිටුවීම හා එමගින් බෞද්ධයන්ට ආත්ම විශ්වාසයකින් යුතුව ක්‍රියාකිරීමට උපකාරී වූ සංවිධාන ව්‍යුහයක් හා ශක්තියක් ලැබීම.
- ඉංග්‍රීසි බෞද්ධ පාසැල් පිහිටුවීම-(උදා: ආනන්ද, ධර්මරාජ, මහින්ද, මියුසියස්) හා බෞද්ධයින් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය දිරිමත් කිරීම.
- බෞද්ධ භික්ෂූණ් අතරම වාදවිවාද ඇතිවීම.
- පුවත්පත්, සඟරා බිහිවීම.
- සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිවීම.
- බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම හා වෙසක් පොහෝ දිනය නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරවීම.
- බෞද්ධ සංවිධාන ඇතිවීම-උදා: මහාබෝධි සමාගම.
- නටබුන්ව පැවති බෞද්ධ වෙහෙර විහාර පුනරුත්ථාපනය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හා සංරක්ෂණය කිරීම ආරම්භවීම.

➢ <u>හින්දු පුනර්ජීවනය</u>

- හින්දු පුනර්ජීවනයේ කේන්ද්‍රීය පුද්ගලයා වූයේ ආරුමුග නාවලර්තුමාය.
- එතුමන් විසින් හින්දු ආගමික ඉගැන්වීම් ක්‍රමානුකූලව සංගෘහිත කරනු ලැබීම.
- බයිබලය දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමට උපකාර කිරීම.
- දෙමළ භාෂා සාහිත්‍යය හා සංස්කෘත භාෂා අධ්‍යාපනය දියුණු කිරීමට පියවර ගැනීම.
- පාසැල් පිහිටුවීමට හා අධ්‍යාපනය නංවාලීමට පියවර ගැනීම. 1849-50 දී වන්නර්පොන්නෙයි සයිව ප්‍රගාස විද්‍යාශාලෙයි පිහිටුවීම, ගම්වල හින්දු පාසැල් පිහිටුවීම.
- ඉංග්‍රීසි අධ්‍යාපනය නංවාලීමට පියවර ගැනීම. 1872 ශෛවංගල විද්‍යාසාලෙයි (පසුව යාපනය හින්දු විද්‍යාලය) පිහිටුවීම.
- වන්නර්පොන්නෙයිහි මුද්‍රණාලයක් පිහිටුවීම හා එමගින් නොයෙකුත් ප්‍රකාශන පළකිරීම.
- නොයෙකුත් සංවිධාන පිහිටුවීම-සයිව ප්‍රගාස සබෙයි, සයිව පරිපාල සබෙයි.

➢ <u>ඉස්ලාම් පුනර්ජීවනය</u>

- සිද්දි ලෙබ්බේ මූලිකත්වය ගැනීම.
- මුස්ලිම් ජාතිකයන් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය නංවාලීමට පියවර ගැනීම.
- 1892 මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටුවීම.
- මුස්ලිම් නේසන් නම් දෙමළ මාධ්‍ය පුවත්පත ඇරඹීම.
- 1894 දී කොළඹ සහිරා හා 1893 දී මහනුවර මුස්ලිම් බාලිකා විද්‍යාලය ඇරඹීම.

(ලකුණු 14 යි)



Scanned with CamScanner

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**(i) දෙවැනි පරාක්‍රමබාහු රජතුමා**

- දෙවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1236-1270) දඹදෙණිය මුල්වරට රාජධානිය කරගත් තුන්වැනි විජයබාහු රජතුමාගේ වැඩිමහල් පුත්‍රයා හා අනුප්‍රාප්තිකයා විය.
- එතුමාගේ රාජ්‍ය සමය දේශපාලන, ආගමික හා සංස්කෘතික වශයෙන් කැපී පෙනෙන අවධියක් විය.
- <u>දේශපාලන:</u>
  - අභ්‍යන්තර හා බාහිර තර්ජන මර්දනය කර දේශපාලන ස්ථාවරභාවයක් ගොඩනැගීම.
  - වන්නි පාලකයන් අවනත කරගැනීම.
  - කාලිංග මාඝ පළවා හැරීම.
  - චන්ද්‍රභානුගේ ආක්‍රමණය පරාජය කිරීම.
  - පාණ්ඩ්‍ය ආක්‍රමණ මැඩලීම (මේ පිළිබඳව මූලාශ්‍රගත තොරතුරු අපැහැදිලිය).
- <u>ආගමික හා සංස්කෘතික:</u>
  - දඹදෙණියේ දළදා මැඳුරක් කරවීම.
  - දළදා වහන්සේ බෙලිගල සිට දඹදෙණියට වැඩම කරවීම.
  - දළදා පූජා පැවැත්වීම.
  - උපසම්පදා කර්ම සඳහා අනුග්‍රහ දැක්වීම.
  - ශාසන සංශෝධනය හා දඹදෙණි කතිකාවත ප්‍රකාශයට පත්කරවීම.
  - අනුරාධපුර හා පොළොන්නරු නගර ප්‍රතිසංස්කරණය කරවීම.
  - දිවයිනේ විවිධ ස්ථානවල වෙහෙරවිහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.
  - පිරිවෙන් ඉදිකිරීම (නන්දන, පළාබත්ගල, දඹදෙණිය විජයසුන්දරාරාමය).
  - භික්ෂු අධ්‍යාපනයට අනුග්‍රහ දැක්වීම.
  - රජතුමා උසස් අධ්‍යාපනයක් ලැබූ පඬිවරයෙකු වීම හා ග්‍රන්ථකරණයේ යෙදීම (කව්සිළුමිණ, විසුද්ධිමග්ගසන්නය, වනවිතිසසන්නය)
  - රජු කලි කාළසාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන විරුදයෙන් හැඳින්වීම.
  - රජු ග්‍රන්ථකරණයට අනුග්‍රහ දැක්වීම. සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාවන්ගෙන් විවිධ ක්ෂෙත්‍ර අළලා ගද්‍ය, පද්‍ය ග්‍රන්ථ රචනාවීම (පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, හත්ථවනගල්ලවිහාරවංසය, භෙසජ්ජමඤ්ජුසා, සිදත් සඟරාව).

**(ලකුණු 07 යි)**

**(ii) කෝට්ටේ යුගයේ සාහිත්‍යය**

- ලංකාව එක්සේසත් කළ සයවන පරාක්‍රමබාහු රජුගෙන් ඇරඹෙන කෝට්ටේ යුගය දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන සෑම අංශයකින්ම දියුණුවක් අත්කරගත් වීම.
- ගිහි පැවිදි අධ්‍යාපනය දියුණුවීම හා සාහිත්‍යයේ දියුණුවක් ඇතිවීම.
- එකල විසූ ගිහි පැවිදි පඬිවරුන්ගෙන් සාහිත්‍යයේ දියුණුවට සුවිශේෂී දායකත්වයක් ලැබීම.
- මේ පඬිවරුන් සිංහල, පාලි, සංස්කෘත හා දෙමළ යන භාෂාවන්ගෙන් විවිධ ක්ෂෙත්‍ර අළලා ගද්‍ය, පද්‍ය ග්‍රන්ථ රචනා කිරීම.
- ඒ අනුව මහා කාව්‍ය, බුදුගුණ කාව්‍ය, සංදේශ කාව්‍ය, උපදේශ ග්‍රන්ථ, ප්‍රශස්ති ග්‍රන්ථ රචනාවීම.



Scanned with CamScanner

- විදාගම මෛත්‍රිය හිමි - බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, හංස සන්දේශය.
- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි - කාව්‍යශේඛරය, පඤ්චිකාප්‍රදීපය, සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය.
- වැත්තැවේ හිමි - ගුත්තිල කාව්‍යය.
- ශ්‍රී රාමචන්ද්‍ර භාරතී - භක්තිශතකය.
- සයවන පරාක්‍රමබාහු රජතුමා - රුවන්මල නම් නිඝණ්ඩුව.
- සරජෝතිමාලෙයි නම් දෙමළ ජ්‍යොතිෂ්‍යශාස්ත්‍ර ග්‍රන්ථය.'
- ධම්මදින්නාචාර්ය විමලකීර්ති හිමි - සද්ධර්මරත්නාකරය.
- ඉරුගල් කුලතිලක පිරිවෙන්පති හිමි - කෝකිල සන්දේශය.
- සයවන පරාක්‍රමබාහු රජු පිළිබඳ රචිත පැරකුම්බා සිරිත.
- නන්තුර්තුනෙයියාර් විසින් රුවන්මල පද්‍යයට නැගීම.

(ලකුණු 07 යි)

**(iii) පෘතුගීසීන් හා යාපනය රාජධානිය**

- පෘතුගීසීන් පැමිණෙන විට ස්වාධීන රාජධානියක් වශයෙන් යාපන රාජධානිය පැවතිණි.
- 16 වන සියවස පුරා අවස්ථා දෙක තුනකදී පමණක් පෘතුගීසීහු එම රාජධානිය කෙරෙහි උනන්දු වූහ. ඒ ආගමික හේතු මතය.
  නිදර්ශනː 1591 දී මෙන්ඩොන්සා නම් සෙන්පතියා යාපනේ රජු මරාදමා පරරාජසේකරම් බලයට පත් කළේ එම රජුගේ කතෝලික විරෝධී ප්‍රතිපත්තිය හේතු කොටගෙනය.
- 1617 පරරාජසේකරම් මිය යන අවස්ථාව වනවිට මුලු දිවයිනම යටත් කරගැනීමට පෘතුගීසීන් තීරණය කොට තිබිණි. යාපන රාජධානිය සම්බන්ධ ඔවුන්ගේ ප්‍රතිපත්තිය වෙනස් වූයේ එබැවිනි.
- අනෙක් අතට, උඩරට විදේශ වෙළදාමට පරරාජසේකරම් සහයෝගය දැක්වීමට තීරණය කිරීමද ඔවුන්ගේ ප්‍රතිපත්තිය වෙනස් වීමට හේතු විය.
- පරරාජසේකරම් කතෝලික විරෝධීවීම මෙන්ම ඔහු පෘතුගීසීන්ගේ අලි ඇතුන් වෙළදාමට බාධා කිරීමද මේ වෙනස්වීමට බලපෑවේය.
- පරරාජසේකරම්ගේ ඇවෑමෙන් බලය පැහැරගත් ශංකිලි යාපන රාජධානියේ ස්වාධීන බලයක් වර්ධනය කර ගැනීමට ගත් උත්සාහය පෘතුගීසීන්ට තර්ජනයක් විය.
- 1619 මලබාර් ප්‍රදේශයෙන් පැමිණි යාත්‍රා මන්නාරම් මුහුදේ සැරිසරන බව දුටු පෘතුගීසීන්ට යාපන පාලකයා ඉන්දිය හා ලන්දේසි ආධාර ලබාගැනීමට උත්සාහ ගන්නා බවට සැකයක් ඇති විය.
- කුස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා මෙම යාත්‍රාවලට පහරදීමට නාවික හමුදාවක් සමග පිටත්විය. ශංකිලි මර්දනය කිරීම සඳහා පිලිප් ද ඔලිවෙයිරා යටතේ විශාල හමුදාවක් යවන ලදී.
- නාවික ප්‍රහාරය මලබාර් ප්‍රතිප්‍රහාර හමුවේ අසාර්ථක විය.
- කෙසේවෙතත්, ශංකිලි ඔලිවෙයිරාගේ හමුදාවට පරාජය වී පෘතුගීසි අත්අඩංගුවට පත්විය.
- මේ අනුව 1619 දී යාපන රාජධානිය පෘතුගීසීන්ට යටත් විය.

(ලකුණු 07 යි)



Scanned with CamScanner

### (iv) නායක්කර් පෙළපත

- 1739 දී ශ්‍රී විජය රාජසිංහ රජවීමත් සමග නායක්කර් පෙළපතේ පාලනය ආරම්භ වීම.
- සෙනරත් රජු සිය පුතුන් හට මධුරාපුරයෙන් බිසෝවරුන් ගෙන්වාදීමත් සමග ඉන්දියාවේ නායක්කර් පෙළපත හා මෙරට පාලකයන් අතර සම්බන්ධතා ආරම්භ වීම.
- දෙවන රාජසිංහ, දෙවන විමලධර්මසූරිය හා නරේන්ද්‍රසිංහ යන රජවරුන් මධුරාපුර බිසෝවරුන් ගෙන්වාගැනීමේ සිරිත අඛණ්ඩව පවත්වාගෙන යාම.
- නායක්කර්වරුන් මුල් යුගයේදී රජ මාළිගාවේ රජුට අයත් පෞද්ගලික සේවා සැපයීමේ කටයුතුවල යෙදීම.
- ලංකාවට පැමිණීමෙන් පසු නායක්කර්වරුන් මුල් කාලයේදීම උඩරට රාජ්‍යය තුළ වෙනම ප්‍රභූ පන්තියක් ලෙස වර්ධනය වීම.
- කල්යාමේදී නායක්කර්වරුන් සංඛ්‍යාත්මකව වැඩිවීම.
- 1739 දී ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු නීත්‍යානුකූල උරුමක්කාරයෙකු නොමැතිව මියගිය බැවින් රජ බිසවගේ සහෝදරයා වූ නායක්කර් වංශික ශ්‍රී විජය රාජසිංහ රජවිය. මෙය රජකම උරුමවීමේ නව සම්ප්‍රදායක ආරම්භය වීම.
- ඔවුන් බෞද්ධාගමට අනුග්‍රහය දක්වීම හා එමගින් තම දේශපාලන බලය තහවුරු කර ගැනීම.
- පිළිවෙලින් ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධි රාජසිංහ හා ශ්‍රී වික්‍රම රාජසිංහ යන නායක්කර් පාලකයෝ මෙරට පාලනය කළහ.
- රාජාධි රාජසිංහ රජුගේ මරණයත් සමග සම්ප්‍රදායානුකූලව රාජත්වය උරුමවිය යුතුව තිබුණේ රාජාධි රාජසිංහ රජුගේ බිසවගේ සොහොයුරාට (මුත්තුසාමි) වුවද පිළිමතලාවේ අදිකාරම්ගේ මැදිහත්වීම මත බිසවගේ සහෝදරයෙකුගේ පුත්‍රයෙකු වූ කන්නසාමි කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජවිය. ඔහු මෙම පෙළපතේ අවසාන පාලකයා විය.
- නායක්කර් පෙළපතට උඩරට රාජධානිය සම්බන්ධයෙන් පැවති රාජ්‍ය උරුමය 1815 ගිවිසුම මගින් අහෝසි කර දමන ලදී.
- නායක්කර් පෙළපතේ රජවරු මෙසේය:
    - ශ්‍රී විජය රාජසිංහ (1739-1747)
    - කීර්ති ශ්‍රී රාජසිංහ (1747-1782)
    - රාජාධි රාජසිංහ (1782-1798)
    - ශ්‍රී වික්‍රම රාජසිංහ (1798-1815)

**(ලකුණු 07 යි)**

### (v) රාජ්‍ය මන්ත්‍රණ සභාව

- මෙතෙක් පැවති ව්‍යවස්ථාදායක සභාව වෙනුවට 1931 දී පිහිටුවන ලද රාජ්‍ය මන්ත්‍රණ සභාව සෝල්බරි ව්‍යවස්ථාව යටතේ 1947 පාර්ලිමේන්තු ක්‍රමය පිහිටුවන තෙක් ක්‍රියාත්මක විය.
- මෙම කාලය තුළ රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රීන් තෝරාගැනීම සඳහා මැතිවරණ දෙකක් පැවැත්විණ. 1931 හා 1936 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සංයුතිය මෙසේ විය.
    - පළාත්බද ඡන්දයෙන් තෝරාගත් මන්ත්‍රීන් - 50
    - ආණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් පත්කළ මන්ත්‍රීන් - 8
    - රාජ්‍ය නිලධාරීන් තිදෙනා (රාජ්‍ය ලේකම්, මුදල් ලේකම්, නීති ලේකම්)
- රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමය තුළ පහත සඳහන් ලක්ෂණ දැකිය හැකිය:
    - එතෙක් පැවති ජාතිමූල නියෝජන ක්‍රමය අහෝසිකොට සර්වජන ඡන්ද බලයෙන් පළාත්බද මන්ත්‍රීන් 50ක් තෝරාගැනීම.
    - ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වීම.



Scanned with CamScanner

- [illegible] හා නාමකරණයෙන් පත්වූ මන්ත්‍රීවරුන් කාරක සභා 7 කට බෙදා රාජ්‍ය පාලන කටයුතු භාරදීම. එම කාරක සභා 7 මෙසේ ය: ස්වදේශ කටයුතු, කෘෂිකර්ම හා ඉඩම්, පළාත් පාලන, සෞඛ්‍ය, කම්කරු, කර්මාන්ත හා වාණිජ, අධ්‍යාපන, ප්‍රවාහන හා ප්‍රසිද්ධ වැඩ
- මෙම කාරක සභා ක්‍රමය ලන්ඩන් කවුන්ටි කවුන්සිලයේ පාලන ක්‍රමයට සමාන විය.
- කාරක සභාවේ සභාපතිවරයා ඇමති ලෙස නම් කෙරිණ.
- කාරක සභා හතේ අමාත්‍යවරුන් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් අමාත්‍ය මණ්ඩලය සමන්විත විය. එහි සභාපති රාජ්‍ය ලේකම් වූ අතර උප සභාපති වූයේ ඇමතිවරයෙකි.
- රාජ්‍ය පාලනයෙහිලා වැදගත් වූ ආරක්ෂක, විදේශ කටයුතු, මුදල් හා අධිකරණ කටයුතු රාජ්‍ය නිලධාරීන් තිදෙනාට පවරා තිබිණි.
- පාලනයෙහිලා ස්වදේශිකයන්ට වැඩි බලතල ලැබීම නිසා එතෙක් ආණ්ඩුකාරයාට පැවරී තිබූ ඇතැම් බලතල අඩුකොට විශේෂ බලතල පැවරීම.

➢ රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමය මගින් ස්වදේශිකයන්ට ස්වයං පාලනය පිළිබඳ පුහුණුවක් ලබාදීමේ අරමුණක් තිබිණ. ඒ අනුව, ස්වදේශියයන්ට කථානායක තනතුර, සභානායක තනතුර හා අමාත්‍ය තනතුරු භාරවිණ.

➢ රාජ්‍ය මන්ත්‍රණ සභාවට ව්‍යවස්ථාදායක මෙන්ම විධායක බලතල ද පැවරී තිබිණ.

➢ රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් පෙරට වඩා සුභසාධනය කෙරෙහි අවධානය යොමු වූ බව පෙනේ:
- සුභසාධන නීති (1935 වෘත්තීය සංගම් ආඥා පනත)
- නිදහස් අධ්‍යාපන ආඥා පනත
- සෞඛ්‍ය අංශය පුළුල්වීම (මැලේරියා මර්දනය)
- ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ වීම

➢ රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමය පිළිබඳව දේශීය නායකයෝ සෑහීමට පත් නොවූහ. ඒ නිසා 1932 සිට ආණ්ඩුක්‍රම සංශෝධනය සඳහා රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ උද්ඝෝෂණ සහ යෝජනා ඉදිරිපත් විය.

**(ලකුණු 07 යි)**

**(vi) 1972 ජනරජ ව්‍යවස්ථාව**

➢ 1972 ජනරජ ව්‍යවස්ථාව සකස්කරන ලද්දේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරමිනි. එහෙයින් මෙය දේශීය නිර්මාණයකි. මෙම ව්‍යවස්ථාව 1972 සිට 1978 දක්වා ක්‍රියාත්මක විය. මෙම ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද එකම මැතිවරණය 19[illegible] දී පැවැත්විණ. මන්ත්‍රීවරු 168 දෙනෙකු තෝරාගනු ලැබිණ.

➢ මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමග එතෙක් පැවති සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි විය.

➢ මෙම ව්‍යවස්ථාව ජනරජ ව්‍යවස්ථාවකි.

➢ මෙතෙක් බ්‍රිතාන්‍ය කිරීටය සමග පැවති සම්බන්ධතා මේ සමග අවසන් විය.
- බ්‍රිතාන්‍ය රැජිණ තවදුරටත් මෙරට නායිකාව නොවීය. එහෙයින් අග්‍රාණ්ඩුකාර තනතුර අහෝසි විය.
- ප්‍රිවි කවුන්සිලයට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කෙරිණ.
- ශ්‍රී ලංකාව ස්වෛරී ජනරජයක් විය. ඒ සමග රටේ නාමය ද ශ්‍රී ලංකාව නම් විය.

➢ පාලනය හා සම්බන්ධ ව්‍යවස්ථාදායක බලය පැවරුණේ මහජන ඡන්දයෙන් තෝරාගත් මන්ත්‍රීවරුනගෙන් සමන්විත වූ ජාතික රාජ්‍ය සභාවටය.

➢ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වූයෙන් එතෙක් පැවති සෙනෙට් සභාව අහෝසි විය. ජනතාවගේ පරමාධිපත්‍යය උත්තරීතර බව ප්‍රකාශ වින.



Scanned with CamScanner

- ජාතික රාජ්‍ය සභාවට සීමාවකින් තොරව ව්‍යවස්ථා පැනවීමේ බලයක් පැවරීම. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පැවති සීමා (29 (2) ) ඉවත් කෙරිණ. මෙතෙක් පැවති රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම අහෝසි කෙරිණ.
- විධායක කටයුතු මෙහෙයවන ලද්දේ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසිනි. අහෝසි කළ ඉහත කී කොමිසම් සභා බලතල ක්‍රියාත්මක කරන ලද්දේ විධායකය විසිනි.
- ජනාධිපති ධූරය නාමික විධායකයක් බවට පත් විය.
- මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්ති ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබිණ. ජාතික භාෂාව, ජාතික ආගම, ජාතික ගීය, ජාතික කොඩිය ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබිණ. බුද්ධාගම ආරක්ෂා කරන බවට හා පෝෂණය කරන බවට වගන්ති ඇතුළත් විණි.

(ලකුණු 07 යි)

******